(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 7.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 අගෝස්තු 31 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

---

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු කපිල අතුකෝරල මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු දිලුම් අමුණුගම මහතා

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සනත් නිශාන්ත මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු ඩී. බී. හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXIII කොටස, පස්වැනි කාණ්ඩයේ VII කොටස සහ හයවැනි කාණ්ඩයේ XIV හා XV කොටස්; සහ

(ii) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I කොටස සහ සිව්වැනි කාණ්ඩයේ I, II හා III කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්ය සාධනය සම්බන්ධ වාර්තාවේ - IX කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය වෙත ලැබී ඇති—

(i) මුදල් අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 01 කොටස;

(ii) විදේශ මූල්‍යායන ව්‍යාපෘති පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 04 කොටස;

(iii) මහ නගර සභා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 06(i) කොටස;

(iv) නගර සභා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 06 (ii) කොටස;

(v) දිස්ත්‍රික් ලේකම් කාර්යාල පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකලොස්වන කාණ්ඩයේ 01 කොටස; සහ

(vi) අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකලොස් වන කාණ්ඩයේ 01 කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අගෝස්තු 05 දිනැති අංක 2291/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි පිළිගන්වා එම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් එම වාර්තාව, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2022.07.01 සිට 2022.07.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද නියෝග කරන ලදී.

(10) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2020 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද නියෝග කරන ලදී.

(13) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය නියෝග කරන ලදී.

(15) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය නියෝග කරන ලදී.

(16) වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය නියෝග කරන ලදී.

(17) බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය නියෝග කරන ලදී.

(18) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(19) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ,පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2.මහජන පෙත්සම් පිළිගැන්වීම:**

මුල්ලේරියාව, පුබුදුගම, අංක 40, දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩී.සිරිසේන මහතාගෙන් ලැබුණු 2022.03.18 දිනැති පෙත්සම ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— සුළු හිමිකම් අධිකරණවල දී අනුගමනය කරනු ලැබීමට නියමිත කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**4.අධිකරණ සංවිධාන (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6.සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7.ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන):** විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද, විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1944 අංක 54 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**9.විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත:** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2022 අගෝස්තු 30),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(අ. භා.1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.05 ට ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 12.25 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.45 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.24 ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු තාරක බාලසූරිය මහතා ගරු නිපුණ රණවක ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.27 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා.4.29 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"විවාදය දැන් කල් තැබිය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන්, විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය 2022 සැප්තැම්බර් 01 බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.

**10. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් 2022 අගෝස්තු 29 සභා සම්මතිය අනුව නියෝජ්‍ය කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 අගෝස්තු 29 සභා සම්මතිය අනුව 2022 සැප්තැම්බර් 01 බ්‍රහස්පතින්දා පූ. භා 9.30 වනතෙක් කල් ගියේය.